**පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක: එන්සීපී/2011/01**

මගේ අංකය : එන්සීපී/සීඑස්/පීටී/බී/1/10(2011)-ii
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරුමැද පළාත,
අනුරාධපුරය.
2011 ජනවාරි මස 04 දින.

සියලුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## වියදම් සඳහා බලාධිකාරය පැවරීම - 2011

2010 අංක 01 දරණ විසර්ජන ප්‍රඥප්තියේ විධි විධාන ප්‍රකාරව 2011 මුදල් වර්ෂය සඳහා අනුමත අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා 1987 අංක 42 දරණ පළාත් සභා පණතේ 19(3) වගන්තියේ විධි විධාන ප්‍රකාරව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් බලපත්‍ර අත්සන් කර ඇත.

I. සාමාන්‍ය පොදු සේවාවන් සඳහා 2011 අංක 01 දරණ සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය.

II. අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් 2011 අංක 02 දරණ අත්තිකාරම් වොරන්ට් බලපත්‍රය.

III. විශේෂ නීති සේවා කටයුතු සඳහා 2011 අංක 03 දරණ විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍රය.

ඒ අනුව ගෙවීම් වවුචර් වල සහ වෙනත් ලියවිලි මත ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් විසින් බලාධිකාරය සටහන් කිරීමේදී ඉහත පරිදි සටහන් කළයුතුය.

### 02. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් :

I. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් යටතේ පනවා ඇති උපරිම වියදම් සීමාවන්ට යටත්ව කටයුතු කළයුතු අතර, කිසිදු හේතුවක් මත එම අත්තිකාරම් ගිණුම් වල උපරිම වියදම් සීමා සංශෝධනය සම්බන්ධව සළකා බලනු නොලැබේ. එහෙත් සාධාරණ හේතු මත අවම ලැබීම් සීමාව සහ උපරිම හර ශේෂ සීමාව සංශෝධනය සඳහා වන ඉල්ලීම් සළකා බලනු ලබන අතර, එවන් ඉල්ලීම් මුදල් වර්ෂය අවසන් වීමට ප්‍රථම ඉදිරිපත් කළයුතුය.

II. ණය අත්තිකාරම් ගෙවීමේදී පහත ප්‍රමුඛතාවයන් අනුව කටයුතු කළයුතුවේ.

(අ) උත්සව අත්තිකාරම්
(ආ) විශේෂ අත්තිකාරම්
(ඇ) ආපදා ණය
(ඈ) පාපැදි ණය

## 03. වාණිජ අත්තිකාරම් ගිණුම් :

වාණිජ අත්තිකාරම් ගිණුම් අලාභ පිට පවත්වාගෙන නොයායුතු බවට අවධාරණය කෙරේ. එම ගිණුම් යටතේ පනවා ඇති උපරිම වියදම් සීමාවන්ට යටත්ව කටයුතු කළයුතු අතර, උපරිම වියදම් සීමාවන් සංශෝධනය සඳහා වන ඉල්ලීම් සළකා බලනු නොලැබේ. එහෙත් සාධාරණ හේතු මත අවම ලැබීම් සීමාව සහ උපරිම හර ශේෂ සීමාව සංශෝධනය පිළිබඳව වන ඉල්ලීම් සළකා බලනු ලැබේ.

04. 2011 වර්ෂය සඳහා අනුමත කර ඇති ප්‍රතිපාදන මනා මූල්‍ය විනයකින් යුක්තව වියදම් කිරීමට කටයුතු කිරීම සියලුම ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීමක් වේ. ඒ අනුව අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් මූල්‍ය ප්‍රතිපාදන ඉහළ කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් යුතුව මූල්‍ය සම්පත් කළමනාකරණය කරගැනීමට ඔබගේ උපරිම දායකත්වය සහ කැපවීම ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.තලාකොටුනගේ,
ප්‍රධාන ලේකම්,
උතුරුමැද පළාත.

පිටපත්: 01. ගරු ආණ්ඩුකාර තුමා, උතුරුමැද පළාත - දැ.පි.
02. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, උතුරුමැද පළාත - දැ.පි.
03. ගරු අමාත්‍යතුමන්ලා, උතුරුමැද පළාත - දැ.පි.
04. විගණකාධිපති.